සියලු ම හිමිකම් ඇවිරිණි/All Right Reserved / முழுப் பதிப்புரிமையுடையது

# ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය
# இலங்கை அபிவிருத்தி நிருவாக நிறுவகம்
# SRI LANKA INSTITUTE OF DEVELOPMENT ADMINISTRATION

**ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ සහ ශ්‍රී ලංකා වාස්තු විද්‍යාත්මක සේවයේ නිලධාරීන් සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2020(I)**

| කාලය: පැය 03 | මූල්‍ය ක්‍රම - 05 -II | විභාග අංකය<br>Index No / சுட்டெண்<br>.................................... |
|---|---|---|

- **ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.**

---

01. I. පාර්ලිමේන්තු යෝජනාවක් සම්මතවීමක් නොමැතිව ඒකාබද්ධ අරමුදලින් මුදල් වියදම් කිරීම සඳහා ජනාධිපතිවරයාට බලය ඇති අවස්ථා කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

    II. රජයේ අමාත්‍යාංශයක/දෙපාර්තමේන්තුවක වාර්ෂික කෙටුම්පත් ඇස්තමේන්තු පිළියෙල කිරීමේ දී ජාතික අය වැය දෙපාර්තමේන්තුව වෙත ලබා දෙන තොරතුරු පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

02. I. පරිපූරක ඇස්තමේන්තුවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ හැකි අවස්ථා මොනවාදැයි දක්වන්න. (ලකුණු 10)

    II. රාජ්‍ය ආදායම් ඇස්තමේන්තු සකස් කිරීමේ දී ආදයම් සේ නොසලකන ලැබීම් වර්ග පහක් (05) සඳහන් කරන්න. (ලකුණු 10)

03. I. "රජයේ විගණනය (ව්‍යවස්ථාපිත විගණනය)" හා "අභ්‍යන්තර විගණනය" අතර වෙනස කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

    II. ඔබගේ ආයතනයට ලැබී ඇති විගණන විමසුමක් සම්බන්ධයෙන් ක්‍රියා කළ යුතු ආකාරය මුදල් රෙගුලාසි ඇසුරෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 10)

04. I. මුදල් රෙගුලාසි 139 ප්‍රකාරව ගෙවීම් කිරීමට බලයලත් නිලධාරියෙකු විසින් තම ගණන්දීමේ නිලධාරියාට වගකිවයුතු කරුණු මොනවාදැයි සඳහන් කරන්න. (ලකුණු 10)

    II. චෙක්පත්වලින් ගෙවීම් කිරීමේ දී අනුගමනය කළ යුතු ආරක්ෂක පියවරයන් මොනවා ද? (ලකුණු 10)

05. I. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව භාණ්ඩ හා සේවා ලබා ගැනීම සඳහා භාවිත කරනු ලබන ප්‍රසම්පාදන ක්‍රම පහක් (05) නම් කරන්න. (ලකුණු 05)

II. රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමේදී "මුදලට අගය" ලඟා කරගැනීම සඳහා ඔබ කරනු ලබන යෝජනා මොනවා ද? (ලකුණු 15)

06. කෙටි සටහන් ලියන්න.

I. ව්‍යවස්ථාපිත අරමුදල්

II. වීරමොං පරිපාටිය

III. රාජ්‍ය ගිණුම් කාරක සභාව

IV. හානි සම්බන්ධයෙන් වූ ප්‍රාරම්භක වාර්තාව

(ලකුණු 05 x 4 = 20)

***********